# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/26 – 2011 ජනවාරි 05 වැනි බදාදා – 2011.01.05

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: බිය3/1/1/237(2).

වර්ෂ 2008 මැයි 12 වැනි දින අංක 1549/1 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 3437 දරන පිඹුරේ කැබලි අංක 14 කැබලි අංක 64 සහ 65 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 64**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, නුවර පාර; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. ඩී. සුනීතා, අංක 146/ඒ, නුවර පාර, ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0044.

**කැබලි අංක 65**

ඉඩමේ නම: වරි. අංක 859, නුවර පාර; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඩී. විමලාවතී, අංක 467, පුවක් වැටිය, නුවර පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0031.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 පෙබරවාරි මස 22 වැනි දින පූ. භා. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 පෙබරවාරි මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ටී. ඩී. එස්. පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2010 දෙසැම්බර් මස 29 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සපුගස්කන්ද,
මාකොළ.

01 – 387

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 3/3/1/7/6.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්/03/ජේ/95/එච්ඩබ්/152.

අංක 1662/32 - 2010 ජූලි 15 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් දිනයන් හා ස්ථානයන් පහත සඳහන් ලෙස සංශෝධනය කර ඇති බව සලකන්න.

| *කැබලි අංකය* | *පරීක්ෂණය පැවැත්වෙන සංශෝධන ස්ථානය* | *පරීක්ෂණය සඳහා පැමිණිය යුතු සංශෝධනය කළ දිනයන් හා වේලාවන්* | *අයිතිවාසිකම්වල ස්වභාවයත් ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරය පිටපත් දෙකකින් මා වෙත දැන්විය යුතු සංශෝධනය කළ දිනය* |
|---|---|---|---|
| 01-17 | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2011.03.01 - පෙ.ව. 9.30 | 2011.02.15 ට පෙර |
| 18-35 | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2011.03.03 - පෙ.ව. 9.30 | 2011.02.15 ට පෙර |
| 36-53 | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2011.03.04 - පෙ.ව. 9.30 | 2011.02.15 ට පෙර |
| 54-71 | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2011.03.08 - පෙ.ව. 9.30 | 2011.02.15 ට පෙර |

එල්. ඒ. සුජාතා විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2010 දෙසැම්බර් මස 23 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

01 – 388

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.